කෙටි කතාව

සෙනෙහසක කතාවක්

විනීතා තලේරත්න

සවස හය වන්නටත් කලින් අදුර විසින් අවට ගිල ගනිමින් තිබිණ. කාමරයේ විදුලි පහන දල්වනු වෙනුවට කවුථව අසලට පා නැගූ නෙත්මා හිස් අහස දෙසට දෑස් යොමු කළාය
ඇතින් දිලෙන ලාම්පු කණු වල ආලෝකය කනාමැදිරි එලි සේ ඇගේ නෙත ගැටින

පොසොන් සද නැගෙමින් තිබින

පාලුවක් තනිකමක් වැනි කුමක් දෝ හැඟීමක් ඇයගේ සිත පරාද කරමින් නැගී සිටිනු නෙත්මාට දැනි. ඇයට කල්ප සිහි විය ඔහු මේ වේලාවේ කුමක් කරනු ඇද්ද? තමා පිළිබඳව සිතන්නට තරම් ඔහුට විවේකයක් තිබේද? දහසකුත් එකක් රාජකාරි ඔහුගේ හිස මත පැටවී ඇත

නෙත්මා තුළ අනියත බියක් වැඩෙන්නට විය යම් හෙයකින් ඔහුගේ සෙනෙහස තමාට අහිමිව ගියහොත්

'අප බලාපොරොත්තුවන යම් දෙයක් ලැබීමෙන් අප ලබන ආශ්වාදය තාවකාලිකය එහෙත් එය කඩවීමෙන් ලබන ශෝකය සදාකාලිකය'

එහි මොන තරම් සත්‍යයක් ගැබ් වී ඇත්ද? ජීවිතයේ යතාර්ථය නෙත්මාගේ දෙනෙත නොදැනුවත්වම කඳුලින් බර වන්නට වූයේ නමුදු ඇය එය වලක්වන්නට වෑයම් නොකළාය අඩු තරමින් සිතේ බර ඒ ලෙසට හෝ නිදහස් වනවා නම්

ඊ ලග දිනයේ කල්ප මුණ ගැසුන විට ඇසිය යුතු ප්‍රශ්ණ වැලක් ඇය සිතෙහි සනිටුහන් කරන්නට වූවාය

' කල් ඔයා මට ඇත්තටම ආදරෙයිද?'

' ඔවු ළමයෝ ඔවු ඇයි ඔයා මගෙන් ඒ වගේ ප්‍රශ්ණයක් අහන්න හිතුවෙ' ඔහු විමසනු ඇත 'ඇත්ත කියන්න ඔයා මට මුලු හිතින්ම ආදරේද එහෙම නැති නං වචනෙට විතරද?

ඔහු දගකාර දෙනෙතින් යුතුව විනාඩියක් දෙකක් තමා දෙස බලා සිටිනු ඇත අනන්තයට යන ඔහුගේ දෑස දෙස බලා සිටිය නොහැකිව තමා ඒ දැසට පරාද වනු ඇත ඉන් පසුව ඔහු නිහඬවම තම ඇඟිලි තුඩු පිරිමදිමින් එය තේරුම් ගන්නට ඉඩ හරිනු ඇත

එහෙත් ඔහුගේ සෙනෙහස පිළිබඳව සත්‍යය දැනගැනිමට නෙත්මාට අවශ්‍යය (පුංචි සමන් මලට අවශ්‍යයි)

'ඔයා දන්නවද මං ඔයාට ආදරේද කියල'

' මං එහෙම හිතනව' ඔහු පිලිතුරු දෙනු ඇත

' ඒත් ඔයා දන්නවද ඇත්ත මං ඔයාට ආදරේ කරන්න හිතුවෙ නෑ . . . ඒක ඉබේ සිද්ද උන දෙයක් ඔයා අහල තියෙනවද නැපෝලියන් හිල් කියන ප්‍රසිද්ධ දාර්ශනිකය එයාගෙ සාර්ථකත්වයේ මූල ධර්ම කියන පොතේ ලියල තියෙන දෙයක් සමහර සිත් එකිනෙකට මොන තරම් දුරට සමහන් වේදැයි කිවහොත් එබඳු සිත් මුණ ගැසීමේ අනිවාර්ය ප්‍රතිඵලය දුටු මතින් ආදරය ජනනය විමයි '

ඔහු කිසිවක් නොපවසා සුපුරුදු දග'කාර දැසින් එය සත්‍යයක්දැයි පිරික්සන්නට මෙන් තමා දෙස බලා සිටිනු ඇත.

ගගන ගැබ සඳට නොදුරින් කුඩා තරුවක් පායා ඇත. එය දීප්තිමත්ව බබලයි හරියට මං වගේ' ඇයට සිතින. අවසාන වතාවට කල්ප තමාට මුන ගැසුනු සාදයේදී හමුවූ දීප්ති නෙත්මාට එකවර සිහිපත් විය.

ඇගේ දෑසේ වූ තේරුම් ගැනීමට අපහසු වූ ඒ බැල්ම. ඇය කල්ප දෙස බැලූ ආකාරය සහ ඇගේ මුහුණ පුරා ලියැවී තිබුනු ඇතැම් හැඟීම් තමාගේ සිත කලබලයට පත් කරන්නට සමත් වූවා නොවේද? සමහර විටක ඇය ඔහුගේ රාජකාරි සඳහා හවුල් වන්නියක විය හැකිය කෙනෙකු පිලිබඳව දුටු විගස යම් යම් නිගමන වලට බැසීමට තරම් පටු අදහස් නෙත්මාට නැත එහෙත් දීප්ති ගේ දෑසේ විසිරී තිබුනු ජයග්‍රහනයේ බැල්ම කල්ප වෙතට එල්ල වූ ආයාචනික දැස් ඇය කල්ප හඳුනනු ඇත්තේ තමා මුන ගැසෙන්නටත් කලින් විය නොහැකිද?

රොන් පිරුන මලක්..

සැබවින්ම දීප්ති කල්පගේ ජීවිතයට බලපා ඇත්තේ කුමන ලෙසකටද? එහෙත් ඒ පිළිබඳව දැන ගැනීමේ සම්පූර්ණ අයිතියක් තමාට තිබේද? නෙත්මා සිතන්නට වූවාය

'මල් තියෙන්නෙ ඉඹින්න නෙලන්න.. ඒ ඔහුගේ අදහසය

'නෑ නෑ නෑ... එහෙම වෙන්න බෑ'

නෙත්මාට නැවත වරක් නැපෝලියන් හිල්ගේ පොතක වු සටහනක් සිහිපත් විය.

'හැම පිරිමියෙක්ම බහු කාන්තා සේවනය පතන්නෝය.. එය එසේ නොවේ යැයි කෙනෙකු පවසන්නේ නම් ඔහු හැට පිරුණු මහල්ලෙකු විය හැකිය. නොඑසේ නම් යම් කිසි දුබලතාවයකින් පෙලෙන්නෙකු විය හැකිය..

බඹරුන්ගේ අවධානය යොමු කරවා ගැනිම පිණිස පාට පාටින් පිපෙන මල් රෝස උඩවැඩියා බාඳුරා නොයෙකුත් විදියේ මල්.. ඒත් සමන් මල ඒ වගේද..? සුවඳ හමන සුදු පාට පුංචි මල .. බෑ බෑ බෑ... සමන් මල වෙනත් මල් එක්ක සසඳන්න බෑ.. ඒ නිසා නොවේද දෙවියන්ට පිදෙන මාලයකට පවා සමන් මල් යොදා ගන්නෙ?

නෙත්මාගේ මුවින් නොදැනුවත්වම ගින්දරක් සමග සුසුමක් පිටවිය.

අවට කලුවරය. ඈත දිලෙමින් තිබුනු පුංචි තරුව වළාකුලකට වැසී ගොසිනි එහෙත් තවත් අලුත් තරු ගොන්නක් අහස පුරා විසිරී ඇත .

නෙත්මා හැඟීමකින් තොරව ඒ දෙස බලාසිටින්නට වූවාය.

'ට්‍රි ං ට්‍රි ං ට්‍රි.ං ට්‍රි දුරකතනය නාද වෙනු නෙත්මාට ඇසිනි.

අලස කමින් යුතුව එතැනට පිය නැගූ නෙත්මා රිසීවරය ඔසවා ' හලෝ' කීවාය. අනික් කෙලවරෙන් ඇසුනේ නොපුරුදු පිරිමි කට හඬකි.

' ඉස් නෙත්මා දෙයා කැන් අයි හැවි අ වර්ඩ් විත් හර් (මට නෙත්මා එක්ක කතා කරන්න පුලුවනිද)

' යස්.... ස්පිකිං (කතා කරනවා)'
' මම චාමර.... දිප්තිගෙ හස්බන්ඩ්'

නෙත්මාගේ සිත එක් වරම අනිසි බියක් සහිත හැඟීමකින් වෙලී ගියේ ය.

'ඇත්තද මං දන්නෙ නෑ'

මං හිතන්නෙ ඔයා දිප්තිව දන්නව..'

' මට නං හරියට මතකයක් නෑ'

'කිසිවෙකු දීප්ති තමාට හඳුන්වා දුන් බවක් නෙත්මාට මතක නැති බැවින් එය බොරුවක් නොවේ නෙත්මා සිතුවාය.

' එහෙනං මං මතක් කරල දෙන්නම්කො... දිප්ති වැඩ කරන්නෙ කල්ප එක්ක'

හරි හරි මං හිතන්නෙ මං දැකල ඇති.. ඉතිං ඇයි චාමර මට කතා කළේ...? මුකුත් පනිවිඩයකටද? ' හැකි තාක් සංසුන් වන්නට වෑයම් කරමින් නෙත්මා ඇසුවේ තමාගේ හඬ වෙනස් නොවන්නටද පරිස්සම් වෙමිනි.

' පනිවිඩයකට වඩා වැදගත් දේකට... ඔයා කල්පගෙ ගර්ල් ප්‍රෙන්ඩ් නේද? එයාට කියන්න පවුල් කඩා ඉහිරවන්න හදන්නෙ නැතුව එයාගෙ පාඩුවෙ ඉන්න කියල ..' ඔහුගේ හඬ' කෝප සහගතය.

' ඉතිං චාමරට තිබුනනෙ ඒක එයාටම කියන්න..' නෙත්මා කීවේ ධෛර්ය උපදවා ගනිමිනි.

' ඔවු.. මං එයාටත් කිව්ව.. මේක ඕස්ට්‍රෙලියාව උනත් සදාචාරය කියල දෙයක් අපි පුරුදුවෙලා තියෙනව.. කියල' දුරකථනය මහ හඬක් නගමින් විසන්ධි විය. ඒ හඬ එක් කනක දෝංකාරය ඉතිරි කළ අතර නෙත්මාගේ සිත තුළ වැඩෙන්නට වූයේ කලකිරීමකි.

එක අතකට තමා දුටු දෙය තවත් දැසකින් දකිනු නොහැකිද?

කිසිවෙකු කි බසක් ඇසුවා නොව කනට බොරු කරමිද කෙසේ දුටු දෙය මගෙ නෙතට

නෙත්මාගේ මුවින් කවි පද දෙකක් ගලා ආවේය.

සැබවින්ම දිප්ති හා කල්ප අතර සම්බන්ධයක් පවතින්නේද..? නොඑසේ නම් ඒ දැඩි හිතවත් කමක් පමනක්ද? ශ්‍රී ලාංකිකයන් වන අප මෙහි පවතින සමාජ රටාව අනුව සියල්ල අපේ පිවිත වලට ආදේශ කර ගැනිමට යාමෙන් සිදුවන ගැටලුවක්.. නෙත්මා සිතන්නට වුවාය.

කල්ප තමාට ආදරය කරන්නේය යන හැඟීම ඇය තුළ පවතින නමුදු දැන් දැන් ඒ පිළිබඳව හටගන්නේ සැකයකි.

ආදරයක් ඇති වෙන්නේ විශ්වාසයක් මත නොවේද? විශ්වාසයක් නැති තැනක ආදරයක් පවතින්නේද? කුඩා දරුවකු මුලින්ම තම මවට ආදරය කරයි. ඒ ඇය තමාට විශ්වාස බැවිනි. ඉන් පසුව පියාට සොහොයුරු සොහොයුරියන්ට වැඩිහිටියෙකු වු පසුව හිත මිතුරන්ට..
ඒත් එකවරම දුටු මතින් බැද'න හදවත්.....
පොත් පත් වල සද'හන් වන ආකාරයට නම් එය මොලයේ ක්‍රියාකාරිත්වය හා බැද්'නකි. සංසාර ගත බැඳීමක් යැයි පැරැන්නෝ විශ්වාස කළහ.
එහෙත් තමාත් කල්පත් අතර ඇත්තේ කුමන ආකාරයේ බැඳීමක්ද?

චිත්ත තරංග වල බලය පිළිබද'ව අද ලෝකයේ කොතෙකුත් පර්යේෂන පැවැත්වේ. ඒ කුමන ආකාරයකට යටත් වුවද විශ්වාසයක් නොමැති තැනක ආදරයක් පවතින්නේද? නෙත්මා සිතන්නට වුවාය.

ආදරය පිලිබද'ව හරියාකාරව තේරුම් ගන්නට තරම් නෙත්මාගේ සිත තවම මෝරා නැත .

' රජ පවුලේ චාල්ස් කුමරු සුරුපී ඩයනාගෙන් වෙන් වී කැමිලා හා එක් වූයේ කුමන හේතුවක් නිසාද?

නෙත්මා සිතන්නට වූවාය.

දුරකථනය නැවත නාද වෙනු ඇයට ඇසින. ඒ ගමන කවුද?උවමනා කෙනෙක් නම් ආන්සරින් මැෂීමට පනිවිඩය තියාවී. ඇය සිතුවේ කලකිරීමකිනි.
දෙතුන් වතාවක් නාද වූ පසුව පිලිතුරුදීමේ යන්ත්‍රය ක්‍රියාත්මක වනු නෙත්මා උදාසිනව අසා සිටියාය.
' නෙත්... මං කල්.... ඔයා කතා කරන කං මං බලා ඉන්නව...
සියල්ල අමතකව ගොස් නෙත්මාගේ සිත නැවත වරක් පුරුදු ආදරයෙන් පිරී ගියේය. සංසාරගත බැඳීමක්.

නිමි

සන්නස
සාහිත්‍ය තරගාවලිය 2006
විස්තර අගෝස්තු සන්නසෙන්